# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2295/57 - 2022 සැප්තැම්බර් මස 03 වැනි සෙනසුරාදා - 2022.09.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/PAN/04/04/02/21.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/8/2013/PC/518.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 738 ගෝමරය ග්‍රාම නිලධාරි වසමේ ගෝමරය ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මු. පි. මහ 6890 දරන 2019.01.12 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් විස්තර හා සතර මායිම් වලින් සමන්විත ඉඩම:

**කැබලි අංක 1**

ඉඩමේ නම: ගෝමරයවත්ත; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 1.1172

*සතර මායිම්* :

*උතුරට*: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගෝමරයවත්ත; *නැගෙනහිරට*: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගෝමරයවත්ත සහ මෙම පිඹුරේ කැබලි අංක 03; *දකුණට*: කැබලි අංක 3, රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගෝමරයවත්ත සහ කැබලි අංක 2; *බටහිරට*: කැබලි අංක 2 සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගෝමරයවත්ත;

*හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය*

රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 21,
මිරානියා වීදිය,
කොළඹ 12.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් 21 වැනි දින ප. ව. 2.00 ට පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 නොවැම්බර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

නිරංජන් ශ්‍රීමන්ත සේනාධීර,
ප්‍රාදේශීය ලේකම්,
පන්විල කොට්ඨාසය.

2022 අගෝස්තු මස 29 වැනි දින,
පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 09 - 0036


1A - G 37402 – 43 (2022/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ශුද්ධිපත්‍රිකාවයි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය* : 4-3/05/2018 HA/454.
*ප්‍රාදේශීය ලේකම් ගොනු අංකය*: බෙන්/2/7/3/29.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.04.01 දිනැති අංක 2273/84 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ නිකුත් කළ ප්‍රකාශනයේ දැක්වෙන ඉඩම් හිමිකම් පරීක්ෂණය පිළිබඳ විස්තර පහත පරිදි සංශෝධනය කළ යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ඉඩමට අදාළ හිමිකම් පරීක්ෂණය 2022.04.07 වැනි දින පූ. හා. 10.00 ලෙස හැඳින්වූ අතර එම දිනය 2022.10.19 දිනය ලෙස සංශෝධනය කරන ලදී.

තව ද, 2022.10.12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

බන්දුල ප්‍රීතිරාජ් අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2022 අගෝස්තු මස 29 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.